மாதிரி (இலக்கம் 02)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා - 492

ආයතනයේ නම - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍ය වරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 492

நிறுவனத்தின் பெயர் - பகிரங்க சேவை ஆணைக்குழு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களையும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Parliamentary Series No - 492**

**Name of the institution - Public Service Commission**

Submission of observations of the Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

ආකෘති (අංක.01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා - 492

ආයතනයේ නම - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු | නිවැරදි කිරීමට ගත් පියවරයන් හා වර්තමාන තත්ත්වය |
|---|---|
| **පළමු කොටස : 99.00** | |
| සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | මෙම කාර්යාලයේ ඇති වාහන 16 අතරින් 7ක් නිලධාරින් වෙනුවෙන් අනුයුක්ත කර ඇති අතර තවත් වාහන දෙකක් අනුයුක්ත කිරීම සඳහා විකල්ප වාහන ලෙස වෙන් කර ඇත. (KO 6157, KT 4591) මෙම හේතුවෙන් එම වාහන සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නැත. (රා.ප.චක්‍රලේඛ 26/92 අනුව)<br>තවද, මෙම කාර්යාලය වෙත මුදල් අමාත්‍යාංශයෙන් පවරා දී නොතිබූ NC 5817 රථය සහ අපහරණය කිරීම සඳහා යෝජිතව තිබූ PA 8180 යන වැන් දෙක සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොමැති අතර රාජ්‍ය ලාංඡන පින්තාරු කිරීම රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුවෙන් ඉටු කරවා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| **දෙවැනි කොටස : 87.00** | |
| ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. | අප ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන නිල වෙබ් අඩවියෙහි (psc.gov.lk) මහජනතාවට පැමිණිලි හෝ ප්‍රශංසා ඉදිරිපත් කිරීම හෝ සටහන් කිරීම සඳහා වූ පහසුකමක් දැනට නොමැත. එහෙත් අප ආයතනයේ හා සියලුම මාණ්ඩලික නිලධාරීන්ගේ දුරකථන අංක හා විද්‍යුත් ලිපිනයන් වෙබ් අඩවියෙහි "අප අමතන්න" යන මාතෘකාව ඔස්සේ පළකොට ඇත. දැනටමත් එම ලිපිනයන් වෙත මහජනතාව තමන්ගේ ගැටළු යොමු කරන අතර නිරන්තරයෙන් දුරකථන ඇමතුම් ද ලැබේ.<br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ගෙන අවසන් කරන ලද ලිපි සම්බන්ධ වාර්තාවන් අපගේ නිල වෙබ් අඩවියෙහි "නවතම තීරණ" යන කොටසෙහි දිනපතා පළකරනු ලබයි. දැනටමත් මහජනතාව මෙම පහසුකම ඉතාමත් අගයකරමින් පරිහරණය කරමින් සිටී. අදාල අමාත්‍යාංශය මගින් එම තීරණ අදාල නිලධාරීන්ට දැනුම් දීමේ දී යම් ප්‍රමාදයක් ඇති වුවහොත් ඔවුන්ට ඇතිවන අපහසුතාව මින් මගහැරී ඇත. |

| | |
|---|---|
| | තවද, 2023/24 කාල සීමාව තුල දී අප වෙබ් අඩවියට පිවිසෙන ඕනෑම අයකුට "තත්ත්ව ග්‍රහණ" කවුලුව මගින් තමන්ගේ ලිපියට අදාලව කොමිෂන් සභාව විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන් මොනවාද යන්න දැන ගැනීමට ද පහසුකම් සලසා තිබුණි.<br>කෙසේ වුවද අපගේ වෙබ් අඩවියට පිවිස, මහජනතාවට පැමිණිලි හෝ ප්‍රශංසා ඉදිරිපත් කිරීම හෝ සටහන් කිරීම සඳහා වූ වෙනම වෙබ් පිටුවක් ඇතුලත් කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින අතර අප සතු ලිපි කළමණාකරණ දත්ත පද්ධතිය ද වෙබ් අඩවිය හා සම්බන්ධ කිරීමට කටයුතු කරමින් පවතී.<br><br>අංක 2/2018 අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර 2024 වර්ෂයේ සිට පවත්වාගෙන යන අතර 2023 වර්ෂයේ දී අයවැය චක්‍රලේඛ අංක 01/2023 හා එයට අදාළ චක්‍රලේඛවලට අනුගත වෙමින් රජයේ වියදම් පාලනය කිරීම සඳහා කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන බව කාරුණිකව දන්වමි. |

ඩබ්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

පිටපත් -

01. අග්‍රාමාත්‍ය ලේකම්
02. සභානායක, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

} අවශ්‍ය කටයුතු සඳහා සහ කාරුණික දැන ගැනීම සඳහා